# ගූගල් ඇඩ්සෙන්ස්

## ඇඩ්සෙන්ස් (Adsense) යනු කුමක්ද?

ඇඩ්සෙන්ස් යනු සරල වශයෙන් කිව හොත් අන්තර්ජාලය භාවිතා කරමින් මුදල් ඉපැයිය හැකි තවත් ක්‍රමයක් පමණයි. නමුත් ඇඩ්සෙන්ස් සියල්ලට වඩා වෙනස්. සංකීර්ණ ජාලයකින් සැදුම්ලත් මෙම පද්ධතිය හරහා ඔබගේ වෙබ් අඩවියට හෝ බ්ලොග් අඩවියට ඇසට නැරඹීමට පහසු දැන්වීම් ලබාදෙනවා. එම දැන්වීම් යම් අයෙකු ක්ලික් (Click) කරවිට ඔබට යම් කිසි මුදල් ප්‍රමාණයක් ලබා දෙනවා. මෙය ඇත්තෙන්ම කොමිෂන් එකක්. ඔවුන්ට ලැබෙන මුළු මුදලින් සුළු කොටසක් ඔබට ලැබෙනවා. මෙම මුදල සමහර විට $ 0.01 (ආසන්න වශයෙන් රුපියලක්) සිට $ 0.50 (ආසන්න වශයෙන් රුපියල් පණහක මුදලක්) හෝ ඊටත් වඩා විය හැකියි.

ඔබ එමඟින් එකතු කරගන්නා මුදල් ඩොලර් සියය ($100) සම්පූර්ණ වූ පසු චෙක් පතක් මඟින් මුදල් එවනවා. එම මුදල ඔබගේ බැංකු ගිණුමට බැර කර ගැනීමට හැකියි.

මෙම ක්‍රමය භාවිතා කරමින් සමහරක් වෙබ් අඩවි නිර්මාණකරුවන් රුපියල් වලින් පවසනවානම් මාසයකට ලක්ෂ ගණනින් මුදල් ඉපයනවා.

## ඇඩ්සෙන්ස් (Google Adsense) ගිණුමක් ලබා ගැනීම - How to apply for Google Adsense

ඇඩ්සෙන්ස් ගිණුමක් ලබා ගැනීම ඉතාමත් පහසුයි. ඔබට තිබිය යුතු එකම සුදුසුකම වනුයේ වෙබ් අඩවියක් හෝ බ්ලොග් අඩවියක් තිබීමයි. ඔබේ වෙබ් අඩවිය වැඩියිටියන් සඳහා පමණක් නම් ඔබගේ වෙබ් අඩවිය ගූගල් ඇඩ්සෙන්ස් ගිණුමක් සඳහා සුදුසුකම් ලබන්නේ නැහැ. එමෙන්ම ඔබගේ වෙබ් අඩවිය සිංහල අකුරු භාවිතයෙන් සාදා ඇත්නම්, ඔබ ඔබගේ වෙබ් අඩවියේ එය පිළිබඳව සටහනක් යොදන්න. මන්දයත්, ඔවුන් සතුව බොහෝ විට සිංහල අක්ෂර නැති වීමට පුළුවන්. එනිසා ඔවුන්ට ඔබගේ වෙබ් අඩවියේ දැකගැනීමට ලැබෙන්නේ සිංහල අකුරු වෙනුවට කොටු කිහිපයක් පමණයි. එබැවින් ඔවුන් ඔබගේ ඇඩ්සෙන්ස් ගිණුම ප්‍රතික්ෂේප කිරීමට බොහෝ ඉඩ-කඩ තිබෙනවා.

## වෙබ් අඩවියක් නිර්මාණය කරන්නේ කෙසේද?

ඇත්තෙන්ම වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කිසිදු ගාස්තුවක් වැය වන්නේ නැහැ. ඔබට දැන් නොමිලේම වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට පුළුවන්. ඔබ වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට නොදන්නේ නම්, ඔබට ඔබේම බ්ලොග් එකක් ආරම්භ කිරීමට පුළුවන්.

ඔබගේ බ්ලොග් අඩවිය ආරම්භ කිරීමට http://www.blogspot.com වෙත පිවිසෙන්න

එමෙන්ම තවත් බොහෝ නොමිලේ වෙබ් ඉඩ සපයන්නාවූ වෙබ් අඩවි තිබෙනවා. ඒවාට පිවිස ඔබගේ නොමිලේ වෙබ් ඉඩ ලබා ගැනීමට හැකියාව තිබෙනවා.

වෙබ් ඉඩ ලබා ගත් පසු. ඔබගේ වෙබ් අඩවියට අවම වශයෙන් පිටු 5ක් වත් ඇතුළත් කරන්න. ඔබ මෙම වෙබ් අඩවිය සාදන්නේ කුමක් සඳහාද යන්න සිතා ගැනීමට අපහසු නම් ඔබ පිළිබඳ ඇතුලත් වෙබ් අඩවියක් නිර්මාණය කරන්න.

## කොහොමද ඇඩ්සෙන්ස් අකවුන්ට් එකක් සාදන්නේ..?

1. පලමුව ඔබට ජීමේල් අකවුන්ට් එකක් තිබිය යුතුයි.

2.www.google.com/adsense වෙත පිවිසෙන්න



3.දැන් Email හා Password ලබා දී Log වෙන්න.

4.දැන් Form එක නිවැරදිව සම්පුර්න කරන්න.ඉන්පසු Submit කරන්න

5.දින 3 ඇතුලත ඔබගේ Gmail ගිනුමට Adsense ගිනුම තහවුරු කර Email එකක් ලැබෙනු ඇත. එහි ඇති Link එක කර Adsense ගිනුමට අතුලු වන්න.




6.Adsense setup click කරන්න



6. Get Ads මත Click කර Ad unit select කර Continue කරන්න.

7. අවශය ad size/color වෙනස් කර ගන්න. ad format clickකර ඔබට කැමති ad format එකක් Continue කරන්න.



8. Ad new channel click කල විට දිස්වන කොටුවෙ ad size එක type කර Continue කරන්න.



9.Submit & get code click කරන්න.

10. ඔබ නිර්මානය කර ගත් වෙබ් අඩවියට මේ අකාරයට HTML Code (Copy & paste)එක අතුල් කර ගන්න.නැතිනම් වෙබ් අඩවියට අතුල් කරන්න.Blog Site එකක් නම් gadget මගින් ඇතුලත් කිරිම සිදුකල හැකිය. එය Adsense with Blogger Page එක මගින් ඔබට දැන ගත හැකිය.



# <u>10 Adsense Approval Tips</u>




ගූගල් ඇඩ්සෙන්ස් කියන්නෙ දැනට වඩාත් ප්‍රචලිත මෙන්ම හොඳම විදිහයි Blogging වලින් සල්ලි හොයන්න. ඒත් ඕගොල්ලො හිතුවොත් එක ඉතා පහසුයි කියල ඕගොල්ලොන්ට වැරදිලා. ගූගල් ඇඩ්සෙන්ස් අපිට පාවිච්චි කරන්න පුලුවන් වෙන්නෙ ගූගල් සමාගම අපේ සයිට් එක අනුමත කරොත් විතරයි. සමහර අයටනම් ගූගල් ඇඩ්සෙන්ස් ගන්නවයි කියන එකතමයි අමාරුම වැඩේ.

- ## ගූගල් ඇඩ්සෙන්ස් වලින් අපිට සල්ලි හම්බෙන්න කොහොමද ?

ඉස්සෙල්ලා කිව්ව වගේ ගූගල් ඇඩ්සෙන්ස් කියන්නෙ ඇඩ්වර්ටයිසින්ග් නෙට්වර්ක් එකක්. අඩ්වර්ටයිසර්ස්ල ගූගල් ඇඩ්වර්ඩ්ස් වල තමාගෙ ඇඩ් එක දානවා. එතකොට ගූගල් ඇඩ්සෙන්ස් අය මේ ඇඩ්ස් ඇඩ්සෙන්ස් ඇප්පෲව් වෙච්ච සයිට්ස් අතරෙ බෙදා හරිනවා. මේක එගොල්ලො කරන්නෙ ඉතින් සයිට් වලට එන ට්‍රැෆික් එකත් බලල තමයි.

මං හිතන විදිහට අපේ කට්ටිය හොදට දන්නවා ගූගල් ඇඩ්සෙන්ස් ගැන එක මම ලිව්වා ඇඩ්සෙන්ස්ඇප්පෲවල් ටිප්ස් 10 ක්, කියවලම බලන්නකෝ.

1: අන්තර්ගතය

ගූගල් ඇඩ්සෙන්ස් වලට ඇප්ලයි කරනකොට අඩුම ගානෙ වටින ලිපි 50ක් වත් ඔයා පලකරල තියෙන්න ඕනෙ ඔයගෙ සයිට් එකේ. නැත්නම් ඔයා ඇප්ලයි කරන එකේ තේරුමක් නෑ.

2: දර්ශනය හා පසුතලය

තමාගේ වෙබ් අඩවියෙහි පසුබිම හා ආකරශනීයභාවය අඩවියට නරබන්නන් පමනක් නොව අඩ්සෙන්ස් ද ඇදගැනීමට සමත්වේ. වෙබ් අඩවියේහි පහසුවෙන් හැසිරීමට හැකිවුවහොත් ඔබගේ පාඨකයින් මෙන්ම web crawlers ලාද එයට ප්‍රියකරනු ඇත. එම නිසා තම වෙබ් අඩවිය දර්ශනීය සේම වෘතීමය ස්වරූපයක් ගැනීම අඩ්සෙන්ස් ලබගැනීමට හේතුවේ.

3: වෙබ් අඩවියේ අයිතිය

ඇඩ්සෙන්ස් වලට ඇප්ලයි කරන්නකලින් අඩුමගානේ ඔයගේ බ්ලොග් එක මාස 6ක් වත් පරන වෙන්න ඕන. මොකද මීට පෙර අඩ්සෙන්ස් ගත්තු බ්ලොග කට්ටිය වෙන අයට පවරල තියෙනව. මෙහින්දා තමයි ගූගල් අය මෙම කරුනගැන සලකිලිමත් වෙන්නේ. නමුත් ඔයාගෙ බ්ලොග් එකට මාසෙට 200,000 විතර විසිටර්ස්ලා එනවනම් මේක අදාලවෙන්නේ නෑ.

4: අඩවියේ පිරිසිදුභාවය

මේකෙන් මම අදහස් කරේ ඔය සයිට් එකේ පොඩිහිටියන්ට හොද නැති වැඩිහිටියන්ට පමනක් වූ තොරතුරු, පින්තූර හෝ විඩියෝ දර්ශන ඇත්නම් එය කුමන ලෙසකින්වත් ඇඩ්සෙන්ස් අනුමත කරන්නේ නැත.

5: අගනේය බව සහ වටිනා බව

ඔයාගෙ සයිට් එකේ හරි බ්ලොග් එකේ හරි ඔයවිසින්ම ලියපු හරවත් ලිපි තිබ්බොත්, කොපි පේස්ට් නොකරපුව තිබ්බොත් ඒකට ඇඩ්සෙන්ස් ගොඩක් ආසකරනවා. ඒ නිසා ඔයගේ සයිට් එක පහසුවෙන් අනුමත වෙනවා.




## 6: වටිනා ඩොමේනයක් තිබීම

වටිනා ඩොමේනයකට උදාහරනයක් ලෙස www.yourname.com ගතහැකිය. මෙහිදී " ඩොමේනය '.com' වේ. මෙසේ '.com, .org, .net ' වැනි ඩොමේනයක් තිබීම ගූගල් විසින් උසස් කොට සලකන අතර විශේෂ අවදනයක්ද යොමුකරයි. මම එකෙන් අදහස් කරේ '.blogspot.com' ඩොමේනක් තියාගෙන ඇඩ්සෙන් ගන්න බැහැ කියල නෙමෙයි. '.com' ඩොමේනක් තිබ්බොත් වැඩේ පහසුවෙනවා කියලයි.

## 7: සත්ය ප්‍රථමයෙන්

ඇඩ්සෙන් වලට ඉල්ලුම් කරන කොට කවදාවත් අසත්ය තොරතුරු ඇතුලත් කරන්න එපා. මොකද එහෙම කරොත් චෙක් එක වැරදෙන්න පුලුවන්. ඒක නිසා නම, ලිපිනය,දුරකතන අන්කය හරියට දෙන්න. නම දෙනකොට Nick Names දෙන්න එප. ඒ වගේමයි බැන්කුවෙ ගිනුමක තියෙන නමක් දෙන්න ඊට අමතරව ඔයගෙ ගූගල් ප්රොෆිල් එකේ තියෙන නමට ගැලපෙන විදිහට දෙන්න.

Eg: Google Profile – Maleesha Kasun Abesinghe
Bank Account - M.K.Abesinghe
Then Adsense must be -M.K.Abesinghe

## 8: පාඨකයින්ගේ සනත්වය

ඔබේ වෙබ් අඩවියට පැමිණෙන පාඨකයින් නැතහොත් ආගන්තුකයින් ගණන ඉතාම වැදගත්. අඩුමතරමෙ දවසකට විසිටර්ස්ලා ඔයගෙ සයිට් එකට 50ක් වත් එනවනම් තමයි හොද මොකද නැත්නම් ගූගල් ඇඩ්වර්ඩ්ස් වල ඇඩ් දාන ඇඩ්වර්ටයිසර්ස්ල උනත් කැමිතිනෑ සෙනග අඩු සයිට් එකක ඇඩ් දාන්න ඒ නිසා ඇඩ්සෙන්ස් ඉල්ලන්න කලින් ට්රැෆික් එක ගැනත් හිතල බලන්න.

9: උත්සහය වටිනවා පලක් ඇත්නම්

ඔයාගේ සයිට් එක එකපාරක් හරි ඇඩ්සෙන්ස් රිජෙක්ට් උනානම් නැවත නැවත ඇප්ල්යි කරන්න යන්න හොද නෑ. ඒ වෙනුවට කරන්න තියෙන්න සයිට් ඒකේ තියෙන අඩුපාඩු හදාගෙන ටික කාලෙකින් ට්‍රයි කරන එකයි. නැතුව එක දිගට ට්‍රයි කරොත් අකවුන්ට් එක බෑන් කරන්නත් ඉඩ තියෙනවා.

10: කොහේගියත් නීති රීති තියෙනවානෙ

මම උඩින් කියපු කරුණු තමයි ගොඩක් වෙලවට ඇඩ්සෙන්ස් ගනිද්දී ඔයා සලකිල්ලට ගන්න ඕනේ. හැබයි ඉතින් ඔයාට පැයක් විතර පීසී එක ඉස්සරහ වාඩිවෙලා ඉන්න පුලුවන්නම් ගූගල් කොන්දෙසි කියවල් බලන්න එතකොට දනට වඩ වැඩේ ඇබිත්තක් විතර ලේසිවෙයි.

ඔයා මතක තියගන්න ඕනෙ ඔය මේ සයිට් එක හැදුවෙ ඇඩ්සෙන්ස් ගන්න කියල බව සයිට් එක තුලින් හැගෙන්න තියෙන්න එපා. ඒ වගේම ඇඩ්සෙන්ස් වලට ඉල්ලන කොට සයිට් එකේ වෙන ඇඩ්ස් දල තියෙනවනම් එව අයින් කරල ඇප්ලයි කරන්න. එතකොට ගූගල් අයගෙවිශ්වාසය දිනාගන්න පුලුවන් වෙයි.

## ඔබගේ ඇඩ්සෙන්ස් ගිණුම ආරක්ෂා කරගැනීම.

ඇඩ්සෙන්ස් (Google Adsense) මඟින් ඉක්මනින් මුදල් ඉපැයීමට බැහැ. එම නිසාම බොහෝ දෙනා පෙළෙඹනවා තමන්ම එම දැන්වීම් මත ක්ලික් කරමින් මුදල් ඉපැයීමට. ඇඩ්සෙන් පද්ධතිය අපි හිතනවාට වඩා දියුණු තත්ත්වයක පවතිනවා එමෙන්ම ඔවුන් එම පද්ධතිය දිනපතා යාවත්කාල කිරීම් වලට ලක් කරනවා. ඔවුන්ට යම් කිසි සැකයක් මතුවූ සැනින් ඔවුන් ඔබගේ ගිණුම මිනිස් ශ්‍රමය යොදාගනිමින් පරීක්ෂා කරනවා ඔවුන් නිවැරදි ලෙසම ඔබගේ හොරය අල්ලා ගත්තොත් (99%ක්ම අවස්ථාව තිබෙනවා ඔබගේ හොර වැඩේ අසුවීමට ඔබගේ ගිණුම එසැනින්ම අවලංගු කරනවා. එම නිසාම ඔබ ඉතාමත් නීති ගරුකව (http://www.google.com/adsense/terms) ඔබගේ ගිණුම භාවිතා කළ යුතුයි.

+ ඔබම ඔබගේ දැන්වීම් ක්ලික් කිරීමෙන් වැළකී සිටින්න
+ අන් අයට ඔබගේ දැන්වීම් ක්ලික් කරන ලෙස ඉල්ලා සිටීමෙන් වැළකෙන්න
+ Adsense advertisement code එක වෙනස් කිරීමෙන් වැළකෙන්න
+ ඇඩ්සෙන්ස් දැන්වීම් වැඩිහිටියන්ට පමණක් විවෘත වූ වෙබ් අඩවි වල දැමීමෙන් වළකින්න

මේ උපදෙස් කිහිපයක් පමණයි. ඔබගේ ගිණුම ඔබගේ වැරැද්දකින් තොරව අවලංගු වීමටත් ඉඩ කඩ තිබෙනවා. සමහර විට ඔබගේ ව්‍යාපාරික හතුරෙක් ඔබගේ වෙබ් අඩවියේ දැන්වීම් දිගින් දිගටම ක්ලික් කිරීමට පුළුවන් එවිටත් ඔබගේ ගිණුම අවලංගු වීමට ඉඩ තිබෙනවා. එමෙන්ම යම් කිසිවෙකු ඔබගේ හඳුනාගැනීමේ අංකය පිළිබඳ දැනගෙන එම හඳුනාගැනීමේ අංකය භාවිතා කර නුසුදුසු වෙබ් අඩවි වල දැන්වීම් දැමීමට පුළුවන් එමනිසා ඔබගේ ගිණුම අවලංගු වෙනවා.

කෙසේ වෙතත් ඔබගේ ගිණුම ඔබගේ වරදකින් තොරව අවලංගු වුවහොත් ඉක්මණින් ඇඩ්සෙන්ස් (Google Adsense) කාර්ය මණ්ඩලය වෙත අභියාචනයක් (Appeal) මඟින් දන්වන්න ඒ සඳහාhttps://www.google.com/adsense/support/bin/request.py?contact=invalid_clicks_appeal වෙත පිවිසෙන්න. ඔබ අතින් වැරදීමකින් දැන්වීම් ක්ල්ක් වුවහොත් එසැණින්මhttps://www.google.com/adsense/support/bin/request.py වෙත පිවිසෙන්න. ඔබගේ ගිණුම අවලංගු වීමෙන් අනතුරුව බොහෝ විට ඔබගේ ගිණුම නැවත පිහිටුවීමක් සිදු වන්නේ නැහැ. එබැවින් නැවත ගිණුමක් විවෘත කිරීම අපහසුයි.